<u>කාර්ය පත්‍රිකාව</u>

**1.** පන්තිය : 8 ශ්‍රේණිය විෂය : විද්‍යාව අදාල සතිය : 03සතිය පෙබරවාරි

**2.** ඒකකය : 03 **ශාක කොටස් වල විවිධත්වය හා කෘත්‍ය**

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:**

I. විද්‍යාව පෙළ පොතේ 03 පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.

II. ශාකයට මුල් වලින් ඇති ප්‍රයෝජන මොනවාද?

III. සුවිශේෂී අනුවර්තන සහිත ශාක මුල් නිරීක්ෂණය කරන්න.ඒවා අඳින්න.

IV. සුවිශේෂී අනුවර්තන සහිත ශාක මුල් සහිත ශාක හමු වන පරිසර මොනවාද? ලැයිස්තුවක් සාදන්න.

V. කුප්පමේනිය, මොනරකුඩුම්බිය වැනි කුඩා ශාකයක් තෝරා ගන්න. ( පුෂ්ප හා ඵල සහිත ) එම ශාකය මුල් නොකැඩෙන පරිදි ගලවා එහි මුල් සෝදා ගන්න. එම පැළය වියළාගෙන A4 /A3 වැනි ගැළපෙන ප්‍රමාණයේ කඩදාසියක අලවා එහි කොටස් නම් කරන්න.

**4.** ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, **websites, LMS** පාඩම් හා වෙනත් ඉගෙනුම් ආධාරක **(online, offline, printed)** :

I. **e -නැණපියස:**

- **https://www.wordwall.net/play/17817/512/810**

II. **e- තක්සලාව :**

- **https://www.ethaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=123&lang=si**
- **https://www.ethaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=43820**

III. **You tube :**

- https://youtu.be/V3F0NeaO728
- https://www.youtube.com/watch?v=o4qnSzteEiI

**5. මෙම සතිය තුල නියමිත පාඩම් වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :**

i. ශාකයක ප්‍රධාන කොටස් ගවේෂණය කර ඒවායේ රූප සටහන් අඳියි.

ii. ශාකයක ප්‍රධාන කොටස්වල මූලික කෘත්‍ය විස්තර කරයි.

iii. ශාක වල විවිධත්වයට තුඩු දෙන අනුවර්තන පැහැදිලි කරයි.

iv. ශාකයක ප්‍රධාන කොටස්වල අනුවර්තන ඒවායේ සුවිශේෂී කෘත්‍ය වලට සම්බන්ධ කිරීම අරමුණු කර ගනිමින් පරිසරය විමර්ශනය කරයි.

v. සුවිශේෂී අනුවර්තන සහිත ශාක මුල්වල ආදර්ශ එකතු කිරීම හා අඳියි.

vi. ශාක ආදර්ශවල එකතුවක් පිළියෙල කිරීම හා අදාළ තොරතුරු සමඟ ඒවා සංරක්ෂණය කරයි.

vii. ශාකවල විවිධ කොටස්වල විවිධත්වය අගය කරයි.

viii. පරිසර ගවේෂණයේදී පරිසරයට සිදුවිය හැකි හානිය අවම විය යුතු බව පිළිගනියි.

**6. ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය** :

**i.** ශාකයක ප්‍රධාන කොටස්වල අනුවර්තන ඒවායේ සුවිශේෂී කෘත්‍ය වලට සම්බන්ධ කිරීම අරමුණු කර ගනිමින් පරිසරය විමර්ශනය කරන ආකාරය ඉදිරිපත් කිරීමක් කරන්න.( Power point presentation/cue cards presentation )

**ii.** පහත දැක්වෙන විශේෂ මුල් වර්ග පිළිබඳව අධ්‍යානය කර වගුව සම්පූර්ණ කරන්න.

| **මුල් වර්ගය** | **කෙරෙන කාර්යය** | **දැකිය හැකි ශාක** |
|---|---|---|
| කරු මුල් | | |
| කයිරු මුල් | | |
| ආරෝහක මුල් (ආලග්න මුල්) | | |
| වායව මුල් | | |
| වායුධර මුල් (ශ්වසන මුල්) | | |
| සංචිත මුල් | | |
| ප්‍රචාරණ මුල් | | |